# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2317/58 – 2023 පෙබරවාරි මස 01 වැනි බදාදා – 2023.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 277/40 (iv)

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

18 වැනි වගන්තිය යටතේ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 18 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක වන මම, මේ නියමය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා ''ආරක්ෂිත ස්මාරක'' වශයෙන් සලකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරමි.

මේ නියමයේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්මාරක සම්බන්ධයෙන් වන දැන්වීම පුරාවස්තු ආඥාපනතේ 19 වන වගන්තිය ප්‍රකාරව 2022 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 2299/62 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදී.

**විදුර වික්‍රමනායක,**
බුද්ධ ශාසන, ආගමික හා
සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.


1A – G 38748 – 07 (2023/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

### ප්‍රකාශයට පත් කරනු ලබන ආරක්ෂිත ස්මාරක ලේඛනය

01. උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, තෙල්ලිපලෙයි (වලිකාමම් උතුර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ජේ/221, පත්තාවත්තෙයි ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පත්තාවත්තෙයි ග්‍රාමයට අයත් උතුරු අක්ෂාංශ $09^{0}$, $48^{1}$, 00.931'' හා නැගෙනහිර දේශාංශ $79^{0}$, $59^{1}$, 45.388'' ස්ථානයේ පිහිටි පත්තාවත්තෙයි ශාන්ත පිලිප් නේරිස් නමින් හඳුන්වන දේවස්ථානය.

02. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 167 ඉපලෝගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඉපලෝගම ග්‍රාමයට අයත් ඉපලෝගම බෝධිරුක්ඛාරාම විහාරයේ පිහිටි නව ටැම්පිට පිළිමගෙයි ඇති ගල්කණු, ටැම් ලිපිය, සිරිපතුල් ගල් ආදිය.

EOG 02 – 0367